**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල නව සංශෝධිත පනතේ 22 වගන්තිය යටතේ පනවා ඇති විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ජාතික පොත් සංචිතයක් පිහිටුවීම, සංරක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම එක් ප්‍රධාන කාර්යයක් විය. ඒ අනුව නිත්‍යානුකූල තැන්පතුව, පරිත්‍යාග, මිලදී ගැනීම්, හුවමාරු සේවා යනාදී වශයෙන් මණ්ඩලයට ලැබී තිබුණු එකතුව රු.112,360,740 ක් වූ මිලදී ගැනීම් වටිනාකම පමණක් මූල්‍ය ප්‍රකාශනවල පොත් තොගයට ඇතුළත් කර තිබුණි. එසේ වුවත් ආයතනයේ ප්‍රධාන අරමුණු අනුව පොත් වර්ගීකරණය කිරීම, පොත්වල වටිනාකම හඳුනාගැනීම හෝ වටිනාකම හඳුනාගැනීමට කටයුතු නොකෙරුණු පොත් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ ජාතික උරුමයක් ලෙස වර්ගීකරණය කර ඇති පොත් සම්බන්ධව ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | මණ්ඩලයේ ප්‍රලේඛන සම්පත් ගිණුම්ගත කිරීම සඳහා ආරම්භයේ සිට මේ දක්වා ම පවතින පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, ජාතික තැන්පතුව සඳහා මිල දී ගන්නා ලද ප්‍රකාශනවල වටිනාකම පමණක් ගිණුම්ගත කර තිබුණ ද 2022 ඔක්තෝබර් මස සිට ඉදිරියට ජාතික තැන්පතුව සඳහා එකතු වන නොමිල ප්‍රකාශන ද අගය කර ගිණුම්ගත කිරීම සඳහා මේ වන විට පියවර ගනිමින් පවතී. ඒ අනුව 2023 අවසන් මූල්‍ය වාර්තාවේ සිට ජාතික තැන්පතුවට එකතු වන සියලු ප්‍රකාශන අගය කර හෙළිදරව් කිරීමට අපේක්ෂිත බව. | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ජාතික සංචිතයක් පිහිටුවීම, සංරක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම එක් ප්‍රධාන කාර්යයක් බැවින් ඒ යටතේ නීත්‍යානුකූල හා අනෙකුත් ප්‍රලේඛන සම්පත් නිසි පරිදි වර්ගීකරණය කිරීම වටිනාකම හඳුනාගැනීම, ගිණුම්ගත කිරීම හා අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 ජූලි 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මණ්ඩලයේ කාර්යාලීය ගොඩනැගිල්ල පිහිටි ඉඩම නිදහස් ප්‍රදානයක් වශයෙන් මණ්ඩලයට පවරා දී තිබුණද එම ඉඩම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මණ්ඩලයේ භූමිය පිහිටි ඉඩම නීත්‍යානුකූල ව මණ්ඩලය සතු ව නොතිබුණු බැවින් අවසන් මූල්‍ය වාර්තා තුළ හෙළිදරව් කර නොතිබුණ අතර, 2022 වර්ෂයේ දී මෙම ඉඩම නිදහස් ප්‍රදානයක් ලෙස අමාත්‍ය මණ්ඩල සංදේශයකින් මණ්ඩලය වෙත හිමි වී ඇත. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අදාළ තක්සේරු වටිනාකම ලද පසු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ හැකි බව. | මණ්ඩලයට පවරා දී ඇති ඉඩම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී බැංකුව වෙත ලැබී තිබූ එකතුව රු.261,028 ක සෘජු බැර කිරීම්වලට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු නොවන ලෙසට නිසි පරිදි ගිණුම් තැබීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් දී ඇති බව. | කාලච්ඡේදයට අදාළව සෘජු බැර කිරීම් හඳුනාගෙන ආදායම නිසි පරිදි ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරිකිරීමේ බැංකු ගිණුමේ රු.219,763 ක් වූ ශේෂය සනාථ කර ගැනීම සඳහා බැංකු පාස්පොත හෝ ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | මණ්ඩලයේ නමින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ නඩත්තු කරනු ලබන ගිණුම් අංක 100010159417 දරණ ගිණුමේ (පැරණි ගිණුම් අංකය - 22827) පවතින ශේෂය ගිණුම්වලින් හෙළිදරව් කර තිබෙන බව. | සමාලෝචිත වර්ෂයට අදාළවන බැංකු සනාථන අනුව තහවුරු වන ශේෂය මූල්‍ය ප්‍රකාශන යටතේ අනාවරණය කළ යුතුය. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට පුස්තකාල ලිපිද්‍රව්‍ය තොගයේ හා සම්භාව්‍ය කෘති නැවත මුද්‍රණය කිරීමේ ව්‍යාපෘති පොත් තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන හා ගබඩා තොග සමීක්ෂණ වාර්තා සමඟ සැසඳීමේදී රු.1,045,012 ක වෙනසක් පැවතුණි. | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් පුස්තකාල ලිපිද්‍රව්‍ය තොග වටිනාකම වන රු. 552,783.00ක අගය නිවැරදි වන අතර, තොග සමීක්ෂණයේ දී ඇති වී ඇති දෝෂ ගණනයන් හේතුවෙන් සමීක්ෂණ වාර්තාවෙහි සටහන් වටිනාකම් නිවැරදි නොවන බව. | තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා නිවැරදිව පිළියෙල කර එම ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන අනුව පොත් තොගයේ පිරිවැය රු.112,360,740 ක් වුවද පරිග්‍රහණ ලේඛනය අනුව පොත් තොගයේ පිරිවැය රු.45,805,329 ක් වූයෙන් රු.66,564,411ක වෙනස හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමෙහි පෙන්වා දී ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන අනුව දේපල, පිරියත හා උපකරණ යටතේ පොත් තොගයේ පිරිවැය සහ පරිග්‍රහණ ලේඛනය අනුව පොත් තොගයේ පිරිවැය අතර වෙනස හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට මේ වන විට කටයුතු කරගෙන යමින් පවතින බව. | නිවැරදි තොග වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ඊ) | තෑගි ඔප්පුවක් මගින් බණ්ඩාරගම පිහිටි පර්චස් 12 ක ඉඩම හා ඉඩමේ පිහිටි මහල් දෙකකින් යුත් ගෘහ භාණ්ඩ සහිත නිවස 2019 ජුලි 19 වන දින මණ්ඩලය වෙත පවරා දී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | මෙම ඉඩම තෑගි ඔප්පුවක් මගින් මණ්ඩලයට පවරා ගත්ත ද කොන්දේසි සහිත ව පවරා ගැනීමක් සිදු කර ඇති බැවින්, රජයේ දේපළක් ලෙස පවරා ගැනීම ගැටළු සහගත වී තිබේ. කෙසේ වුව ද එහි පූර්ණ අයිතිය මණ්ඩලය සතු වන බැවින් ඉදිරියේ දී ඒ සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීම මගින් වත්කම් ගණනය කර ගනිමින් සිදු කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව නිසි පරිදි මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණයන් සිදුකළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසිය 371 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 (ආ) ඡේදය | කාර්යය නිමකල විගස තත්කාර්යය අතුරු අග්‍රිම පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 05 සිට වර්ෂ 09ත් අතර කාලයක සිට පැවතෙන රු.341,622 ක් වූ අග්‍රිම ශේෂ 17 ක් පැවතුණි. | එම ශේෂය තුළ ඇතුළත් ගනුදෙනුවලට අදාළව රු.2,528.45ක් හැර අනිත් ශේෂයන් මේ වන විට හඳුනාගෙන ඇති බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ii) මුදල් රෙගුලාසි 756, 757 | 2020 දෙසැම්බර් 31 දිනට මිලදීගෙන තිබුණු පිරිවැය රු.112,360,740 ක් වූ පොත් තොගය සහ සංරක්ෂිත පොත් තොගය සමාලෝචිත වර්ෂයේදී ද සමීක්ෂණය කර නොතිබුණි. | ජාතික පුස්තකාල පොත් තොගය 2023 වර්ෂයේ සිට අදියර වශයෙන් සමීක්ෂණය කිරීම සඳහා අභ්‍යන්තර සැලැස්මක් සකස් කර ඇති අතර, පළමු අදියරේ සමීක්ෂණ කටයුතු අවසන් වූ පසු එහි දෙවන අදියර ලෙස ජාතික පුස්තකාල අනු එකතුන් අයත් පොත් තොග සමීක්ෂණය ආරම්භ වීමට නියමිත බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (iii) මුදල් රෙගුලාසි 1647 (ආ) | මණ්ඩලය සතු පිරිවැය රු.32,270,762 ක් වූ වාහන 07 ක් හා මූල්‍ය කල්බදු වාහන 02 ක් සමාලෝචිත වර්ෂයේදී සමීක්ෂණය කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට වාර්ෂික සමීක්ෂණ කටයුතු සිදු කිරීමේ දී ස්ථාවර වත්කම්වලට අදාළ ව වාහන හා උපකරණ පිළිබඳ ව ද සමීක්ෂණ කටයුතු වාර්ෂික ව සිදු කිරීමට තීරණය කරන ලද අතර, ඒ අනුව 2022.12.31 දිනට ස්ථාවර වත්කම් සමීක්ෂණයේ දී මණ්ඩලය සතු වාහන හා උපකරණ පිළිබඳ සමීක්ෂණ කටයුතු සිදු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත | | | |
| | (i) 12(2) (අ) හා (ආ) වගන්ති | පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳව ජාතික සංචිතයක් ලබාදීම, දේශීය හා විදේශීය ප්‍රලේඛන ද්‍රව්‍ය සංචිතයක් පිහිටුවීම, වැඩිදියුණු කිරීම, පවත්වාගෙනයාම හා සංරක්ෂණය සම්බන්ධයෙන් මණ්ඩලයට පැවරී තිබෙන කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන, ප්‍රතිග්‍රහණ හා ග්‍රන්ථ විඥාපන පාලන අංශවල ප්‍රගතිය වාර්තාවලින් පිළිබිඹු වී නොතිබුණු අතර එම අංශවල පිළිවෙලින් ඒකක 33,353 ක්, 9,210 ක්, හා 4,743 ක් අතරැදී තිබුණි. | සංරක්ෂණ ප්‍රතිකර්ම කළ යුතු පොත් ප්‍රමාණයන් අතරැදි ප්‍රමාණ ලෙස පැවතීමට හේතු වනුයේ 2018 වර්ෂයේ සිට රසායනාගාරය ක්‍රියාත්මක නොවීම, එක් ලේඛන සංරක්ෂණ නිලධාරියෙකු පමණක් සංරක්ෂණ කටයුතුවල නිරත වීම බව. | පනත ප්‍රකාරව මණ්ඩලයට පැවරුණු කාර්යයයභාරය කාර්යක්ෂමව ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) 12(2) (උ) වගන්තිය | ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත්කළ යුතු කාල වකවානුව නියම කර නොතිබුණු අතර 2019, 2020 හා 2021 වර්ෂවල ප්‍රමාද වී ග්‍රන්ථ නාමාවලි ප්‍රකාශයට පත් කර තිබුණි. | ප්‍රමාද වී තිබුණු 2019, 2020 හා 2021 ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලි මේ වන විට මුද්‍රණයෙන් පළ කිරීමට කටයුතු කර ඇත. මෙම ප්‍රමාදවීම් සඳහා එම කාල වකවානුවේ පැවති කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වයේ බලපෑම හේතු වී ඇති බව. | පනත ප්‍රකාරව මණ්ඩලයට පැවරුණු කාර්යයයභාරය කාර්යක්ෂමව ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මාස 28 ක් ප්‍රමාද වී 2023 ජුනි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | අද වන විට පැවති ගැටලුකාරී තත්ත්වයන් මගහැර සාමාන්‍ය තත්ත්වයට පත් වෙමින් පවතින අතර, මේ වන විට 2021 වර්ෂයේ අවසන් මූල්‍ය වාර්තාව සකස් කරමින් පවතින බව. | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.378,462,735 ක් වූ දේපල, පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි | මේ වන විට අවසන් ගිණුම්වල ඇති තොරතුරු පදනම් කරගෙන ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරගෙන යමින් පවතින බව. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2020 අගෝස්තු 14 දිනැති අංක SC&PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විදේශ ප්‍රදාන හා ශිල්පීය ආධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබාගත යුතු වුවද 2020 දෙසැම්බර් 16 දින රු.686,040 ක් කැනඩාවේ පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් සංවිධානය විසින් Skill online learning ව්‍යාපෘතිය යටතේ මණ්ඩලයේ බැංකු ගිණුමට සෘජුවම බැර කර තිබුණි. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත සහ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත අනුමැතිය ලබා ගැනීමට ලිපියක් යොමු කිරීමට කටයුතු කරනු ලබන බව.<br>මින් ඉදිරියට මෙවැනි ව්‍යාපෘති සිදු කිරීමේ දී විගණනය විසින් පෙන්වා දෙන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කර ඒ අනුව ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට අවශ්‍ය උපදෙස් දෙන ලද බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,963,702 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,465,100 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.318,602 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 5.23 ක්ද ක්ෂණික අනුපාතය 4.23 ක් ද වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාත පිළිවෙලින් 2.80 ක් හා 1.80 ක් වශයෙන් පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මුද්‍රණය කල රු.2,084,167 ක් වටිනා මණ්ඩලීය ප්‍රකාශන 7,193 ක් 2023 ජුලි 18 දිනවන විටත් බෙදා හැර නොතිබුණි. | මේ වන විට ව්‍යාප්ති අංශය විසින් පොත් බෙදා හැරීමේ කටයුතු ජාතික පුස්තකාල පොත්හල, ප්‍රදර්ශන, වාර්ෂික දායකත්ව ආදි ක්‍රමවේද මගින් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව. | අවශ්‍යතාවය හඳුනාගෙන මුද්‍රණ කටයුතු සිදුකිරීම හා පවතින පොත් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2018 ජනවාරි 24 දින සිට මාස 09 ක කාලයකින් ප්‍රධාන ගොඩනැගිල්ල නවීකරණය කිරීම නිම කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.211,937,795 ක් වූ බදු රහිත කොන්ත්‍රාත්තුවක් කොන්ත්‍රාත් සමාගමකට ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.252,463,612 ක් ගෙවා අවස්ථා 03 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරගෙන තිබුණද 2021 මාර්තු කොන්ත්‍රාත්තුව නවතා දමා තිබුණි. 2021 ජනවාරි 05 දිනැති අංක 15-02-07 දරන සභාපතිගේ ලිපිය අනුව බිම් මහලේ සිට සිව්වන මහල දක්වා අසම්පූර්ණ හා නියමිත පරිදි නිම නොකළ කොන්ත්‍රාත් කාර්යයන් හඳුනාගෙන තිබුණු නමුත් 2022 නොවැම්බර් 09 දින වන විටත් එම අඩුපාඩු සම්පූර්ණ කර නොතිබුණි. | ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු 2021 වසරේ නවතා දමන ලද අතර, මේ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඉතිරි 25%ක පමණ වන ව්‍යාපෘතියේ කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත භාර දී තිබුණු නමුත් එම ආයතනයද පාඩු ලබන ආයතනයක් වී ඇති බැවින් ගොඩනැගිල්ලේ ඉතිරි නවීකරණ කටයුතු කිරීමට සුදුසු පාර්ශවකරුවෙකු තෝරා ගැනීමට නිර්දේශ වී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |